" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/30-38/FI/01(2025) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2025.07.15 |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)

ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)

පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)

ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)

අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ / චක්‍රලේඛ ලිපි බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.07.09 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | විස්තරය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017 (ii) හා 2025.06.04 | ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතන වලට අනුයුක්ත කිරීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 05/2025 හා 2025.06.27 | 2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය |

02. මෙම චක්‍රලේඛ / චක්‍රලේඛ ලිපි පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.ඩී.ජී. ලක්මාල් රූපසිංහ,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092606
ෆැක්ස් අංකය : 011-2092605
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2017(II)

මගේ අංකය : EST-7/04/ALW/2060(v)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2025.06.04

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ප්‍රායෝගික පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කිරීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2017.02.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017 සහ 2017.08.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017(I) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 2017.02.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017හි 7 වගන්තියේ විධිවිධාන අනුව පුහුණුලාභියෙකුට දෛනිකව ගෙවන දීමනාව, 2025.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.1000/- ලෙස සංශෝධනය කරන අතර, එම චක්‍රලේඛයෙහි සහ 2017.08.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2017(I) හි ඇතුළත් අනෙකුත් විධිවිධාන නොවෙනස්ව පවතියි.

03. තවද, ඉහත දීමනා ගෙවීම වාර්ෂික අයවැයෙන් වෙන්වූ ප්‍රතිපාදන මත කළමනාකරණය කරගත යුතු අතර, ඒ සඳහා භාණ්ඩාගාරයෙන් අතිරේක ප්‍රතිපාදන නොඉල්ලිය යුතුය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2697233
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් තැපැල : ade-vii@pubad.gov.lk